# මැණික් කර්මාන්තය හා ඒ ආශ්‍රිත පාරිසරික ගැටළු හා විසඳුම්

ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ ඉතිහාසය වසර 2500 වත් වඩා පැරණි බවට ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. දුර්ලභ ගණයේ ඛණිජ වර්ගයක් වූ මැණික් සඳහා විශේෂිත වූ ඉල්ලුමක් පවතී. හිඟ සම්පතක් වීම, විනිවිදයන සුළු අලංකාර දිලිසෙන ස්වභාවය, කල්පැවැත්ම යනාදි කරුණු නිසා ශ්‍රී ලංකාවේ මැණික් වලට ලෝක වෙළඳ පොලේ සැලකිය යුතු මිලක් පවතී. ලංකාවේ මුළු අපනයන ආදායමෙන් 5% ක් ලැබෙන්නේ ඛනිජ සම්පත් වලිනි. එයින්ද 60% ලැබෙන්නේ මැණික් වලිනි. ඒ අනුව බලනවිට ආර්ථිකයේ සැලකිය යුතු දායකත්වයක් දරණ කර්මාන්තයක් ලෙස, මැණික් කර්මාන්තය හඳුන්වාදීමට පිළිවන. උසස් ආර්ථික වාසි හා සමාජීය ප්‍රයෝජන ඇති වුවද පතල් වල ස්ථායීතාවය, පිහිටීම හා පවත්වාගෙන යන ආකාරය අනුව පාරිසරික හානි ඇතිවීමේ ප්‍රවණතාවය වැඩිය.

## ඓතිහාසික පසුබිම

ලංකාවේ මැණික් කර්මාන්තයට වසර 2500 ක පමණ ඉතිහාසයක් පවතී. එමෙන්ම ලෝකයේ මැණික් හමුවන තායිලන්තය, මැඩගස්කරය, බුරුමය වැනි රටවල් වලින් ලංකාවේ මැණික් සඳහා විශේෂිත වූ ඉල්ලුමක් පවතින අතර, අතීතයේ සිටම කීර්තිනාමයක් හිමිකරගෙන ඇත. විදේශිකයන් විසින් ලංකාව රත්නද්වීප වශයෙන් හැඳින්වීම මෙයට කදිම සාක්ෂියකි. චීන ජාතික පාහියන්, හියුංසාං සහ යුරෝපා ජාතික මාර්කෝපෝලෝ වැනි දේශ ගවේශකයන්ගේ වර්තාවලද ශ්‍රී ලංකාවේ මැණික් ගැන සඳහන් වී ඇත. විදේශීය වෙළඳුන් ලංකාවට පැමිණ ඇත්තේ ප්‍රධාන වශයෙන් මුතු මැණික්, ඇත්දළ හා කුළුබඩු රැගෙන යාමටය. විදේශීය ආක්‍රමණවලටද මෙම සම්පත් විභවතාවය හේතු සාධක වී ඇත.

## ආර්ථික පසුබිම

ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් 2.3% දායකත්වයක් දරන්නේ මැණික් අපනයනයෙනි. එය 1997 වර්ෂයේ මිලියන 5272 දක්වා වැඩි වී ඇත. ( මහ බැංකු වර්තාව 1997 ) එම ප්‍රමාණය 2000 වසර වන විට මිලියන 5741 දක්වා වැඩි වී ඇත. ඒ අනුව වාර්ෂික වර්ධන වේගය 3% කි. වාර්තාගත ආදායම මෙලෙස දැක්වුවද නිල නොවන ආකාරයේ මැණික් අලෙවිය සිදුවන නිසා මීට වැඩි ආදායමක් උපයන කර්මාන්තයක් ලෙස දැක්විය හැකිය. මැණික් කර්මාන්තය ආශ්‍රිත සෘජු රැකියාවල නියුතු ප්‍රමාණය 1,50000 පමණ වේ. රැකියා උත්පාදිත කර්මාන්තයක් ලෙසත්, ජාතික ආදායමට සැලකිය යුතු අපනයන ආදායමක් ලබාදෙන කර්මාන්තයක් ලෙසත්, ජාතික ආදායමට සැලකිය යුතු අපනයන ආදායමක් ලබාදෙන කර්මාන්තයක් ලෙසත්, ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය ආර්ථිකමය වශයෙන් වැදගත් වූ කර්මාන්තයකි.

## භූ විද්‍යාත්මක පසුබිම

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම අනුව, මධ්‍යම කඳුකරයේ සහ නිරිතදිග තැනිතලා ආශ්‍රිත ප්‍රදේශ මැණික් හමුවීමේ විභවතාවයක් පවතී. භූ විද්‍යාත්මක පිහිටීම අනුව ලංකාවේ "උස්බිම් ශ්‍රේණියට" අයත් හැටන්, බගවන්තලාව, නෝර්වුඩ්, මාළිය, වැනි ප්‍රදේශවලත්, මහනුවර දිස්ත්‍රික්කයේ හසලක, මිනිපේ වැනි ප්‍රදේශවලත්, මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල - පල්ලේගම, ඇල හැර, අඹන්ගඟ වැනි ප්‍රදේශවලත් මැණික් නිධි ව්‍යාප්තව පවතී. එමෙන්ම "විජයාන් ශ්‍රේණිය" ට අයත් කතරගම, මොණරාගල, බුත්තල, ඔක්කම්පිටිය වැනි ප්‍රදේශවල සහ රත්නපුර ප්‍රධාන කේන්ද්‍රය කොටගත් "නිරිතදිග කාණ්ඩය" යන භූ විද්‍යාත්මක බෙදීම් ආශ්‍රිත ප්‍රදේශවල මැණික් නිධි බහුලව ව්‍යාප්තව පවතී. මෑතකදී අනුරාධපුර, පුත්තලම, හම්බන්තොට වැනි ප්‍රදේශවලද මැණික් නිධි හමුවී ඇත.




DESTRIBUTION OF THE MAIN GEM FIELDS OF SRI LANKA

භූ විද්‍යාත්මක මැණික් නිර්මානයවීමේ ක්‍රියාවලිය තුන් ආකාරයකට සිදුවිය හැකිය. ආග්නේය අවසාධිත හා විපරිතකරණයේ ප්‍රතිඵලයක් ලෙසත් භූගර්භයේ ඇතිවන රසායනික විපර්යාස හා පීඩන තත්වයන්ට ලක්වීම යන ක්‍රියාවලින් මත මෙම මැණික් වැනි ඛණිජ නිර්මාණ ක්‍රියාවලිය සිදු වේ. මැණික් වලට ආවේණික වු ස්ඵටික වල ස්වරූපයෙන් හා ඒවායේ දෘඪ බව (Hardness) මත මැණික් වල වටිනාකම වෙනස් වේ. වටිනාකම අතින් ඉහල කොරන්ඩම් (Corundum) පවුලේ මැණික් සඳහා ශ්‍රී ලංකාව වැඩි ප්‍රසිද්ධියක් උසුලයි. නිල්කැට, රතුකැට, ආරනුල්, පුෂ්පරාග, පද්මරාග වැනි මැණික් "දෘඪභාවය" අතින් ඉතා ඉහල මට්ටමක පවතී. මේවා හැරුණුවිට අගතිස්, ගෝමේද, රඹහ, පදියම්, තෝරමල්ලි වැනි වටිනා මැණික් වර්ග ගනනාවක් ලංකාවෙන් හමුවේ.

## කර්මාන්තයේ පසුබිම

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්තයක් වු මැණික් කර්මාන්තයේ ක්‍රියාවලිය අනුව එය ප්‍රධාන අවස්ථා දෙකක් යටතේ සාකච්ඡා කළ හැකිය. එනම්, කර්මාන්තයේ ප්‍රාථමික අවස්ථාව හා ද්විතීය අවස්ථාවයි. පොළව පත්ලේ නිධිගතව ඇති මැණික් ඉල්ලම් සොයා ඒවා කැණීම් කර, ගැරීම් වලින් පසු මැණික් වෙන්කර ගැනීම ප්‍රාථමික අවස්ථාවයි. මෙම ප්‍රාථමික අවස්ථාවේදී පරිසරයට සිදුවන හානියද ද්වීතියික අවස්ථාවට වඩා වැඩිය. ලංකාවේ මැණික් නිධි සොයාගැනීම සඳහා සාම්ප්‍රදායික කර්මාන්තකරුවෝ "ඉල්ලම්කුරු" යන උපකරණය භාවිතා කරන ලදී. තාක්ෂණික වශයෙන් වර්තමානයේ "මීගර්" යන "ඉල්ලම්" සෙවීමේ උපකරණයක් මැණික් කර්මාන්තය සඳහා හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ මැණික් කැණීම් සිදුකරන ආකාරය අනුව ප්‍රධාන ක්‍රම 3 කට වර්ග කළ හැකිය. ගොඩපතල් කැණීම, දෝනා පතල් කැණීම හා ගඟ ඇදීම වශයෙන් කැණීම් සිදුකරන අතර, සාම්ප්‍රදායික ක්‍රම භාවිතය බොහෝ දුරට සිදු වේ. මැණික් නිධිගතවී ඇති ආකාරය අනුව ඉල්ලම පොළව මතුපිටට ආසන්නව පිහිටා ඇති අවස්ථාවල සිදුකරන කැණීම් ගොඩපතල් වශයෙන් හඳුන්වයි. දෝනා පතල් යනු පොළව පත්ලේ ගැඹුරු කැණීම් සිදුකර තිරස් දෙසට වු ආංශික කැණීම්ය. රත්නපුර දිස්ත්‍රික්කයේ මාර්ග පද්ධති ගිලා බැසීමට දෝනා පතල් බොහෝ විට බලපා ඇත. ගංගා ඇළ දොළ ආශ්‍රිත පත්ලේ මැණික් කැණීම "ඇඳුම්පතල්" (Riverbed gemming) වශයෙන් හඳුන්වයි. නොගැඹුරු ගංගා මධ්‍යයේ දැව කඳන් දමා ඒ මත සිට ඇදුම් "සවල" වැනි උපකරණ මඟින් "ඉල්ලම්" ඇදීම ඇදුම් පතල් වේ. මැණික් කර්මාන්තය ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්තයක් වන අතර, කුඩා කණ්ඩායම් වලට සීමාවන ශ්‍රම සුක්ෂම කර්මාන්තයක් ලෙස දැක්විය හැකිය.



සාම්ප්‍රදායික මැණික් කැණීම් විධි වලට අමතරව ලංකාවේ අවස්ථා කිහිපයකදී යාන්ත්‍රික මැණික් කැණීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වී ඇත. ඇතැම් අවස්ථාවල ගංගා ආශ්‍රිත යන්ත්‍ර භාවිතයෙන් අනවසර මැණික් කැණීම් සිදුවන බවට වාර්තා වී ඇත. විශේෂයෙන්ම කුරුගඟ, වේ ගඟ, දෙනවක ගඟ, රඹුක ගඟ, නිරිඇළි ගඟ සහ හංගමුව ගඟ වැනි ගංගාවන්ගේ අනවසර යාන්ත්‍රික මැණික් ගැරීම් සිදුවන අතර, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මඟින් ඒවා පාලනය කිරිමට උත්සාහ කර ඇත. ශ්‍රී ලංකාවේ යාන්ත්‍රික මැණික් කැණීම් පිළිබඳව විශේෂ කමිටුවක් පත්කරන ලද අතර, එම කමිටුව මඟින් ලංකාවේ ගංගා ආශ්‍රිත යාන්ත්‍රික මැණික් කැණීම් සඳහා නිර්දේශ ලබා නොදීමට තීරණය කොට ඇත. යාන්ත්‍රික මැණික් කැණීම් ආශ්‍රිතව පාරිසරික හා සාමාජීය වශයෙන් හානිදායක තත්වයක් පවතී. තිරසාර පදනමක් මත සම්පත් පරිහරණය කිරිමේ න්‍යාය මත ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මැණික් කර්මාන්තය යාන්ත්‍රීකරණය කිරීමෙන් අවාසි මෙන්ම වාසි සහගත තත්වයක් පවතී. භූ පත්ලේ නිධිගතව ඇති "ඉල්ලම" මතුපිටට ගෙන යන්ත්‍ර භාවිතයෙන් (සකින් මැෂින්) ඉල්ලම් සෝදා මැණික් වෙන්කර ගැනීම සිදු කරයි. මැණික් කැණීමෙන් ඇති වු වලවල් යන්ත්‍රානුසාරයෙන් විධිමත් පිරිදි භූ විද්‍යාත්මක

තට්ටු වශයෙන් වැසීම සිදුකිරීමෙන් අනතුරුව භූමිය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ඒ මත රුක්රෝපණය වැනි කටයුතු සිදුකළ හැකිය. මේ නිසා කෙටිකාලයක් තුල මැණික් කැණීම ආශ්‍රිත නොවැසූ පතල් වලවල් නිසා භූ ගත ජල මූලාශ්‍ර විනාශවීම, පාංශු ඛාදනය, වාර්මාර්ග කාර්යක්ෂමතාවය අඩුවීම, නායයෑම, ගංවතුර හා මැසි මදුරුවන් ව්‍යාප්තවීම ආශ්‍රිතව මැලේරියා, ඩෙංගු වැනි රෝග බෝවීමේ හැකියාව වැනි තත්ත්වයන් පාලනය කිරීමට රජයට විශාල වියදමක් දැරීමට සිදුවේ.

## ගංගා ආශ්‍රිත මැණික් ඇදීම
(Riverbed gemming)



මේ අනුව බලනවිට පාලනයක් යටතේ යාන්ත්‍රික මැණික් කැණීමේදී ''පාරිසරික පිරිවැය'' අවම කර ගත හැකිය. එහෙත් ගංගා, ඇළදොළ ආශ්‍රිත යාන්ත්‍රික මැණික් කැනීම නිසා සිදුවන පාරිසරික පිරිවැය වැඩිය. සමස්ථයක් වශයෙන් ගත් කල ගංගා ආශ්‍රිත යාන්ත්‍රික මැණික් කැණීම පාරිසරික හානි වැඩිවීමට හේතු සාධක වේ.

පාරිසරික වශයෙන් සහ සාමාජීය වශයෙන් සලකා බලන විට ශ්‍රී ලංකාවේ අනවසර මැණික් ගැරීම් විධිමත් පරිදි පාලනය නොකරන්නේ නම්, ඒ තුලින් ඇතිවන පාරිසරික ගැටළු විසදීම සඳහා විශාල වියදමක් දැරීමට සිදු වේ.

මැණික් කර්මාන්තයේ ද්විතීය අවස්ථාව වන්නේ කැණීම් කර ලබාගත් මැණික් කපා ඔප දමා ඒවා වෙළඳ පොළ වෙත යැවීමයි. මැණික් වල පැහැය සහ ඔප දැමීමෙන් පසු ඇත්වන හැඩය වැනි ගුණාංග මත එහි වටිනාකම තීරණය වේ. මැණික් ඔප දැමීම සඳහා සාම්ප්‍රදායිකව භාවිතා කරනු ලැබුවේ ''හණපෝරුව'' නමැති උපකරණයයි. පසුකාලීනව ඒ සඳහා තායි මැසිම හා ජපන් මැසිම යන යන්ත්‍ර භාවිතායට එන ලදී. නොවටිනා ගල් වර්ගයක් ලෙස සැලකූ ගෙවුඩ තාප පිරියම් කිරීම මගින් වටිනා නිල් මැණික් බවට පත්කිරීමට හැකි වී තිබේ. මේ නිසා අද ගෙවුඩ පිලිස්සීම මැණික් කර්මාන්තයේ වෙනම උප කර්මාන්තයක් ලෙස පවතී. එමෙන්ම මැණික් කර්මාන්තය ආශ්‍රිතව මැණික් ඇල්ලූ ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තයක් ද පවතී. මැණික් ආශ්‍රිතව විවිධ නිෂ්පාදනයන් ඇති කිරීම අපනයන වෙළඳ පොල සැකසීම යන කටයුතු කර්මාන්තයේ ද්විතීය අවස්ථාව වන අතර, මේ ආශ්‍රිතවද විශාල පිරිසක් සේවය කරති. මෙම අවස්ථාවේදී පරිසරයට සැලකිය යුතු හානි දායක තත්ත්වයක් ඇති නොවේ.

## ගංගා ආශ්‍රිත මැණික් ගැරීම නිසා සිදුවී ඇති හානි



## මැණික් කර්මාන්තය ආශ්‍රිතව දැනට මතුවී ඇති පාරිසරික ගැටළු

මැණික් කර්මාන්තයේ ප්‍රාථමික අවස්ථාවේදී පාරිසරික වශයෙන් විශාල පාරිසරික ගැටළු මතු වේ. ගොඩපතල් මෙන්ම ඇඳුම් පතල් ආශ්‍රිතවද, අනවසර යාන්ත්‍රික මැණික් කැණීම් ආශ්‍රිතවද විශාල පාරිසරික ගැටළු දැනට උද්ගතවී ඇත. එවැනි ගැටළු සමහරක් මෙසේ දැක්විය හැකිය.

- ගංගා පතුල් වල මැණික් ගැරීමේදී ගං ඉවුරු වලට හානි සිදු කිරීම
- ගොඩපතල් වලවල් මැණික් කැණීමෙන් පසු ක්‍රමානුකූලව වසා නොදැමීම

- ජලතල වල ඉල්ලම් සේදීමේ ක්‍රියාවලියේදී මැටි සහ මඩ ගංගා ඇළදොළ වලට එක්වීම
- ගොඩපතල් ආශ්‍රිතව ඉල්ලම් සේදීමෙන් ඉවතලන ජලය සෘජු ලෙසම ගංගා ඇළදොළ වලට මුදාහැරීමේදී අවසාධනය සිදුවීම.
- නොවැසු මැණික් පතල් වටා එක්රැස්වී ඇති අස්ථාවර පස් කඳු මගින් පාංශු ඛාදනය සිදුවීම.
- ඉවුරු කැඩීම හේතුවෙන් ගංගා ඇළදොළ වල ඉවුරු පළල්වීම හා ස්වභාවික ගැලීම් රටාව වෙනස්වීම.
- ගංගා පතල් වල සිදුවන ඇදුම් පතල් හා ගොඩපතල් සඳහා අවශ්‍ය ආධාරක දැව සඳහා ගස් කපා දැමීම.

**මැණික් කැණීම ආශ්‍රිතව ඉහත සඳහන් කළ ගැටළු සහගත තත්ත්වයක් නිසා ඇතිවන පාරිසරික බලපෑම් පහත සඳහන් ලෙස පෙලගැස්විය හැකිය.**

- ගංවතුර තර්ජන ( විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ නිතර නිතර සිදුවන ගංවතුර තර්ජන)
- ගං ඉවුරු කඩා වැටීම ( මේ නිසා පාලම්, බෝක්කු වැනි රජයේ නිර්මිතයන් මෙන්ම පෞද්ගලික දේපල වලට හානි සිදුවීම.)
- ගංවතුර ජලය රඳවාගැනීමේ හැකියාව අඩුවන ආකාරයට දියළු තැන්පත් වීමෙන් ගංපතුල ඉහල යාම.
- ඇල පද්ධති ආශ්‍රිතව වාරමාර්ග කාර්යක්ෂමතාවය අඩුවීම
- ජල දූෂණය නිසා ගෘහස්ථ පරිභෝජනයට බලපෑම්, නෑමට සහ බීමට ජලය පාවිච්චි කිරීමේ අපහසුතාවය ඇතිවීම.
- ජලජ ජීවීන් කෙරෙ අහිතකර බලපෑම්, මසුන් බිත්තරලන කලාප වල දියලු තැන්පත් වීම නිසා මත්ස්‍ය සම්පත් විනාශවීම
- අත්හරින ලද විශාල පතල් වලවල් නිසා භූ විෂමතාවය වෙනස්වීම හා මදුරුවන් බෝවීම ව්‍යාප්තවීම ආශ්‍රිතව ලෙඩරෝග පැතිරීම වැනි පාරිසරික සෞඛ්‍යයට බලපාන ප්‍රශ්න.

මෙම පාරිසරික ගැටළු සහගත තත්ත්වයන් සහ පාරිසරික බලපෑම් වලක්වා ගැනීමේ හෝ අවම කර ගැනීමේ ක්‍රමෝපායන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත. ඒවා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇත.

- ගංගාවන්ගේ ඉවුරු හෝ රක්ෂිත කලාපයන් හැරීමෙන් ( ඇදීමෙන් ) වැලකී සිටිය යුතුය.
- ගංගාවන් තුල පිහිටා ඇති ස්වභාවික ගල්පර විනාශ නොකළ යුතුය.
- ගංගා පතුල්වල මැණික් කැණීම අවසන් වූ පසු වැටි ඉවත් කළ යුතුය.
- කුඹුරු ආශ්‍රිත පතල් වැඩ අවසන් වූ වහාම නැවත පුනරුත්ථාපනය කළ යුතුය.
- ඉල්ලම් සේදීමෙන් ඉවතලන ජලය සෘජුවම ගංගාවන්ට වැටීමට සැලැස්වීමෙන් වැලකී සිටිය යුතුය.
- ගොඩපතල් වල වැඩ අවසන් වූ විට එම පතල් වලවල් ක්‍රමානුකූලව වසා දැමීම සිදුකළ යුතුය.
- ගංගාවන්ගේ ස්වභාවික පිහිටා ඇති වෘක්ෂලතාවලට හානිදායක නොවන ලෙස ඉල්ලම් ඇදීම සිදු කිරීමට වගබලා ගත යුතුය.
- ගංගා පතල් වල ඉල්ලම් ඇදීම නිසා ඉවුරට හානි සිදුවූ විට ඉවුරු ක්‍රමානුකූලව පුනරුත්ථාපනය කළ යුතුය.
- ගොඩපතල් වැසීමෙන් පසු ඉඩම් යථාතත්වයට පත්කිරීම සඳහා රුක්රෝපණය වැනි ක්‍රමෝපායන් අනුගමනය කළ යුතුය.
- මධ්‍යම පරිසර අධිකාරිය විසින් මාර්ගෝපදේශ සකස් කර ඒවා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ලබාදී ඇත.

මැණික් කර්මාන්තය පිළිබඳව සෘජුවම මැදිහත් වන වගකීව යුතු ආයතනය වන්නේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියයි. 1971 අංක 13 දරණ රාජ්‍ය මැණික් සංස්ථා පනතින් මැණික්

සංස්ථාව ඇති කළ අතර, 1993 දී එය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ලෙස ස්ථාපනය කරන ලදී. මැණික් පතල් කැණීම, කැපීම, ඔප දැමීම, අලෙවිය, වෙන්දේසිය ආදිය සඳහා බලපත්‍ර නිකුත් කිරීම, මැණික් අපනයනය දිරිගැන්වීම වැනි මැණික් කර්මාන්තයේ පැවැත්ම සඳහා කටයුතු කරනු ලැබේ.

මැණික් ගැරීම නිසා පරිසරයට හානි සිදුවීම අනිවාර්යයෙන්ම සිදුවන බැවින් පරිසර හානි අවම කර ගැනීම සඳහා මාර්ගෝපදේශ (Guidelines) මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ලබාදී ඇත. වගකීමකින් තොරව පරිසරයට හානි කරමින් සිදුකරනු ලබන පතල් කැනීම පාලනය කිරීම යම්තාක් දුරට මෙමඟින් සිදුකළ හැකිය.

මැණික් කර්මාන්තය ආශ්‍රිතව මතුවන පාරිසරික ගැටළු හා බලපෑම් අවම කර ගැනීමේ හෝ වලක්වා ගැනීමේ ක්‍රමෝපායක් ලෙස ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ගංගා ඇළදොල වල් වාර්ෂිකව බඳුදීමට ප්‍රථමව මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබාගනී. එහිදී සිදුකරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණයේදී භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පාංශු විද්‍යාත්මක හා ජල භූ ලක්ෂණ විද්‍යාත්මක කරුණු හා සාමාන්‍ය සමාජමය කරුණුද පදනම් කරගෙන මැණික් ගැරීම සඳහා සුදුසු හා නුසුදුසු ඉඩම් කට්ටි හඳුනා ගැනීම සිදුකරනු ලබයි. එමෙන්ම නිර්දේශ ලබාදෙන අවස්ථාවලදී පොදු ගුරු උපදෙස් වලට අමතරව ස්ථානීය වශයෙන් අවශ්‍ය වන කොන්දේසි ද ඇතුලත් කරනු ලබන අතර, එවා උල්ලංඝණය කරනු ලබන බවට යම් පැමිණිල්ලක් මඟින් හෝ පසුවිපරම් මඟින් හෝ හඳුනාගත් විටදී එම ඉඩම් කට්ටියට අදාල බලපත්‍රය අතිහිටුවීමට හැකි වේ. අත්හිටුවන ලද බලපත්‍රයට අදාල ඉඩමේ පුනරුත්ථාපන කටයුතු ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ තැන්පත් මුදලින් සිදුකරනු ලැබේ.

ගංගා පතල්වල මැණික් කැණීම සඳහා පාරිසරික නිර්දේශ ලබාදීමේදී සැලකිල්ලට ගනු ලබන කරුණු කිහිපයක් පහත සඳහන් පරිදි පෙලගැස්විය හැකිය.

- ගංගා ඇළදොළ වල මැණික් කැණීමේදී තියුණු වංගු සහිත කලාප නිර්දේශ කරනු නොලැබේ.
- ගංගාවේ ගැලීම් රටාව, පාංශු විද්‍යාත්මක සාධක, ජල විද්‍යාත්මක සාධක මත බාදිත හැකියාව වැඩි ප්‍රදේශ සඳහා නිර්දේශ ලබාදෙනු නොලැබේ.
- ගංගා පතුල් වල මැණික් කැණීමේදී ගඟ දෙපස පිහිටි පෞද්ගලික හා රජයේ ඉඩම් වලට තදබල හානි සිදු වී ඇති අවස්ථාවලදී එවැනි ඉඩම් කැබලි වෙන්දේසි සඳහා නිර්දේශ නොකරන අතර, ඉවුරු නැවත පුනරුත්ථාපනය කිරීම සිදු කරනු ලැබේ.
- ගංගා පතුල් වල මැණික් කැණීමේදී රජයේ නිර්මිතනයන්ට පාලම්, බෝක්කු මාර්ග ආදියට හානි සිදුවූ අවස්ථාවලදී හා සිදු වේ යැයි නිගමනය කළ හැකි අවස්ථා වලදී එම ඉඩම් කට්ටි මැණික් ගැරීම සඳහා නුසුදුසු ඉඩම් කට්ටි ලෙස හඳුනාගෙන නිර්දේශ කරනු නොලැබේ.
- පොදු නාන තොටුපලවල් හෝ බීමට ජලය ගන්නා ජල තටාක (ජල ටැංකි) හෝ එවැනි ස්ථාන ඇත්නම් එවාද නිර්දේශ නොකෙරේ.
- වෙනත් පාරිසරික සංවේදී කලාපයක් නම් එවාද මැණික් කැණීම සඳහා නිර්දේශ කරනු නොලැබේ. (වන ජීවී රක්ෂිත, වන රක්ෂිත යනාදිය.)

සමස්ථයක් වශයෙන් ගත්විට මැණික් කර්මාන්තය ආශ්‍රිතව පැනනැගී ඇති පාරිසරික ගැටළු අතර, අනවසර මැණික් ගැරීම් නිසා විශාල වශයෙන් පාරිසරික හානි උද්ගත වී ඇත. නීත්‍යානුකූලව බලපත්‍ර ලබාගෙන සිදුකරනු ලබන පතල් සම්බන්ධයෙන් මතුවන පාරිසරික ප්‍රශ්න සඳහා යම්කිසි මට්ටමක විසඳුමක් තිබුණද අනවසර ගැරීම් සම්බන්ධයෙන් ඇති එකම විසඳුම වැටලීම මඟින් පාලනය කිරීම බව තහවුරු වී ඇත.

මේ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර



කළමනාකරණ හා ඇගයීම් අංශයේ මෙහෙයවීම යටතේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය යන ආයතන වලින් සමන්විත පසුවිපරම් කමිටුවක් මඟින් මෙම අනවසර ගැරීම පාලනය කිරීමට පියවර කිහිපයක් ගෙන ඇත. නීත්‍යානුකූලව බලපත්‍ර ලබාගෙන සිදුකරනු ලබන පතල් ආශ්‍රිත පැන නගින පාරිසරික ගැටළු වලට විසඳුම්ද මෙම පසුවිපරම් කමිටුව මඟින් දැනටමත් ක්‍රියාත්මක කර ගෙන යමින් පවතී.



මීට අමතරව මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ වලට පටහැනිව සිදුකරනු ලබන බගවන්තලාව, බොගවානාඔය ආශ්‍රිත මැණික් ගැරීම් වලට අදාලව ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියට විධානයක් නිකුත් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනට කටයුතු සිදුකරගෙන යමින් පවතී. විශේෂයෙන් රත්නපුර, මොණරාගල, බගවන්තලාව, ඇලහැර යන ප්‍රදේශවල නොවැසූ පතල් විශාල සංඛ්‍යාවක් මධ්‍යම පරිසර අධිකාරියේ මග පෙන්වීම යටතේ වසා දැමීමට පියවර ගෙන ඇත.



ඉඩම් නැවත යථාතත්වයට පත්කිරීම සඳහා රුක්රෝපණ වැඩසටහන් පවත්වන ලද අතර, ඒ ඒ ප්‍රදේශ වල මැණික් කර්මාන්තයේ යෙදී සිටින පතල්කරුවන් පතල් කම්කරුවන් සහ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලදී.

මෙම වැඩ සටහන් තුලින් තිරසාර පදනමක් යටතේ සම්පත් භාවිතයේ අවශ්‍යතාවය පෙන්වාදෙන ලද අතර, මැණික් කර්මාන්තයේ තිරසාර පැවැත්මට අවශ්‍ය වූ පාරිසරික මාර්ගෝපදේශකත්වය මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබා දී ඇත.

**ඩී.එම්.ඒ.කේ.ධනසේකර**
**සහකාර අධ්‍යක්ෂ,**
**(පරිසර කළමනාකරණ හා පසුවිපරම් අංශය)**
**මධ්‍යම පරිසර අධිකාරිය**